# උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය

## අමාත්‍ය මණ්ඩල සංදේශය

<u>රහසයයි</u>

අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය: HETI/HE/UD/2019/28

<u>මෙරට උසස් අධ්‍යාපන පද්ධතිය සඳහා "වරලත් විශ්වවිද්‍යාල" සංකල්පය හඳුන්වාදීම.</u>

**1. පසුබිම**

තම දරුවන් හට උපාධි සුදුසුකම් ලබාදීම සෑම දෙමාපියකුගේම අපේක්ෂාව වන අතර, උසස් පෙළ සමත්වන සියලුම සිසු දරුවන්ගේ සිහිනය තම රුචිකත්වයට අනුකූලව උසස් අධ්‍යාපන සුදුසුකම් සපුරා ගැනීමයි. එබැවින් නව රජයේ රට හදන - සෞභාග්‍යයේ දැක්ම 2020-2025 මධ්‍ය කාලීන සංවර්ධන උපායමාර්ගීක ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ඒ සඳහා අවශ්‍ය වටපිටාවක් සකසා දීම උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය වෙත පැවරී ඇති මුඛ්‍යතම වගකීම ලෙස සලකමි. ඒ අනුව පහත "වරලත් විශ්වවිද්‍යාල" පද්ධතියක් ස්ථාපනය කිරීම මඟින් උසස් අධ්‍යාපන අවස්ථා සඳහා සිසුන්හට නව අවස්ථා බිහිකිරීමට අපේක්ෂා කරමි.

**2. සාධාරණීකරණය**

ලාභ ඉපයීම මුඛ්‍ය අරමුණ නොවූ (Non for Profit) උසස් අධ්‍යාපන ආයතන රාජ්‍ය අනුග්‍රහය යටතේ මෙන්ම පෞද්ගලික දානපතීන්ගේ දායකත්වය මත අප රට තුළ මේ වනවිටත් ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙම උසස් අධ්‍යාපන ආයතන ඉතා උසස් ප්‍රමිතියකින් යුක්තව විවිධ විෂයන් ආශ්‍රිතව උසස් අධ්‍යාපන පාඨමාලා පවත්වාගෙන යනු ලබන අතර, උපාධි ප්‍රදානයට අවසරය ලබා ඇතත්, සම්පූර්ණ ලෙස උපාධි පිරිනමන ආයතන ලෙසට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මෙතෙක් නිල පිළිගැනීමක් සිදුකර නොමැත.

එහෙත් මෙම ආයතන පද්ධතීන්ද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන ආයතන බවට පරිවර්තනය වීම සඳහා කිසිදු අපේක්ෂාවක් නොමැති බව නිරීක්ෂණය කරමි. එයට හේතුවන්නේ යම් හෙයකින් විශ්වවිද්‍යාල කොමිසම යටතේ ක්‍රියාත්මක කරනු ලබන ආයතනයක් වන්නේ නම්, සිසුන් ඇතුලත් කිරීම් Z අගය මත සිදු කිරීමට සිදුවීමත්, එම කොමිසම ක්‍රියාත්මක කරනු ලබන දැඩි කොන්දේසි හමුවේ අදාල ආයතනවලට තම අධ්‍යාපනික පාඨමාලා අපේක්ෂිත ගුණාත්මක හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පවත්වා ගෙනයාමට එම තත්ත්වය බාධාකාරී සාධකයක් වනු ඇති බව විශ්වාස කරන බැවිනි.

**3. නිර්දේශය**

ඉහත තත්ත්වයට ගැලපෙන ප්‍රශස්ත විසඳුමක් ලෙස, දැනටමත් උපාධි ප්‍රදානය සඳහා අනුමැතිය ඇති එහෙත් "විශ්වවිද්‍යාල" ලෙස හඳුන්වා දීමට අවසරයක් නොලද පහත සඳහන් ආයතන පහ සඳහා පහත දැක්වෙන කොන්දේසි වලට යටත්ව, "වරලත් විශ්වවිද්‍යාල (Charted Universities)" යන නම විශ්වවිද්‍යාල කාණ්ඩයට හඳුන්වා දීමට අපේක්ෂා කරමි.

යෝජිත නව "වරලත් විශ්වවිද්‍යාල" කාණ්ඩය සඳහා පළමු අදියරේදී අවශ්‍ය සියලුම මූලික සුදුසුකම් හා යටිතල පහසුකම් මෙන්ම අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සහිත කාර්ය මණ්ඩල වලින් සමන්විත පහත සඳහන් ආයතන 05 හඳුනාගෙන ඇත.

1. NSBM හරිත සරසවිය - පිට්පන, හෝමාගම
2. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය (UNIVOTEC) - රත්මලාන
3. ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලය (SLTC) - මීජේ, පාදුක්ක
4. නාගානන්ද ජාත්‍යන්තර උසස් බෞද්ධ ආයතනය - මානෙල්වත්ත, කැලණිය
5. ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය- පල්ලේකැලේ, මහනුවර (ශ්‍රී දළදා මාළිගාවට අනුබද්ධ)

**4. නිර්දේශිත කොන්දේසි**

I. ඉහත ආයතන ඉදිරියටත් ලාභ නොලබන පොදු සමාජ සුභසාධන පදනමින් පවත්වාගෙන යා යුතුය.
II. කිසියම් අතිරේක ආදායමක් උපයාගතහොත්, එම අතිරික්ත ආදායම් නිශ්චිත ලෙසට එම ආයතනයේ අධ්‍යාපනික සංවර්ධනය සඳහා පමණක් ආයෝජනය කළ යුතුය.
III. යෝජිත වරලත් විශ්වවිද්‍යාලවල සියලුම පාඨමාලා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් අනුමත කරවා ගත යුතුය.
IV. අධ්‍යයන කාර්ය මණ්ඩල සුදුසුකම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නියමයන්ට අනුකූල විය යුතුය.
V. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පාඨමාලා සහ අනෙකුත් පහසුකම් පවත්වාගෙන යා යුතුය.
VI. සෑම "වරලත් විශ්වවිද්‍යාලයකම" පාලක සභාව සඳහා උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු පත් කළ යුතුය.
VII. යම් හෙයකින් ඉහත ප්‍රමිතීන් උල්ලංඝනය කිරීමක් සිදු වුවහොත් හා නිසි පරිදි පවත්වාගෙන නොයන්නේ නම් වසර 02 ක සහන කාලයකින් අනතුරුව "වරලත් විශ්වවිද්‍යාල" තත්ත්වය ඉවත් කිරීම සඳහා උසස් අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ නිර්දේශවලට යටත්ව බලය ලබාදීම.

**5. අනුමැතිය .**

(අ) ඉහත අංක 1 සිට 5 දක්වා නිර්දේශිත, ලාභ නොලබන සහ දැනටමත් උපාධි ප්‍රදානය සඳහා අවසර ලත්, උසස් අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යනු ලබන, උසස් අධ්‍යාපන ආයතන පහ (05) "වරලත් විශ්වවිද්‍යාල" ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහාත්,

(ආ) ඉහත අංක (I) සිට (VII) දක්වා ඇති කොන්දේසි ප්‍රකාරව කටයුතු කිරීම සඳහාත්, එකී කොන්දේසි හා ආයතන 05 ගැසට් නිවේදනයන් මඟින් තහවුරු කිරීමටත්,

ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කරමි.

ආචාර්ය බන්දුල ගුණවර්ධන
උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍ය

2019 දෙසැම්බර් මස 24 දින